පොදු චක්‍රලේඛ ලිපි අංකඃ 02-III/2003.

මගේ අංකයඃ 06/ඩී/13/97,
සෞඛ්‍ය, පෝෂණ හා සුභසාධන අමාත්‍යාංශය,
'සුවසිරිපාය',
කොළඹ - 10.
2003.10.20

CA/SA
22 OCT 2003

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
විමධ්‍යගත කොට්ඨාශ ප්‍රධානීන්,
ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්,
විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන්,
සියළුම මහ රෝහල්/මූලික රෝහල්හි
වෛද්‍ය අධිකාරිවරුන් සහ
දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන් වෙත.,

ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයේ ජ්‍යෙෂ්ඨ ජීව වෛද්‍ය - ඉංජිනේරු තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම.

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ, ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයේ ජ්‍යෙෂ්ඨ ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අදාල අයදුම්පත් මේ සමඟ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සකස්කොට, ලේකම් - සෞඛ්‍ය, පෝෂණ හා සුභසාධන අමාත්‍යාංශය, අංකඃ 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ - 10 යන ලිපිනයට 2003. 11 . 10. දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් මෙම අමාත්‍යාංශයේ ලේකම් හෝ වෙනත් නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

02. වැටුප් පරිමාණයඃ

වර්ෂයකට රු. 1,38,540-7x5,520-1,77,180/=
(රා.ප.ච.ලේ. 2/97 (III) අනුව)

03. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්ඃ

I. පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යුත්/විදුලි/යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධියක් ලබා තිබීම.

II. ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ ඉංජිනේරුවකු වශයෙන් වර්ෂ 05 ක සේවා කාලයක් සපුරා තිබීම.

III. වෛද්‍ය උපකරණ පිළිබඳව අවම වශයෙන් මාස 04 ක විදේශ පුහුණුවක් ලබා තිබීම.

IV. නිලධාරියා පූර්ත වෘත්තීය සුදුසුකම් ලබා තිබිය යුතුය.

සටහනඃ නිලධාරියා පූර්ත වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම යනු, පිළිගත් ඉංජිනේරු ආයතනයකින් ලබාගත් සාමාජිකත්වයයි.

04. වයස් සීමාවඃ

වයස අවුඃ 55 ට නොවැඩි විය යුතුය. (දැනටමත් ස්ථිර රාජ්‍ය සේවයේ යෙදී සිටින අයට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

සැළකිය යුතුයි:

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/91 හි විධිවිධාන යටතේ සම්මුඛ පරීක්ෂණ -යකින් පසුව බඳවා ගැනීම් කරනු ලැබේ.

06. අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කල යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

(වෛද්‍ය රෙජී පෙරේරා),
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා සුභසාධන අමාත්‍යාංශය.

ක/-031008.

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයේ
ජ්‍යෙෂ්ඨ ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුරට බඳවා ගැනීම සඳහා වන
ආදර්ශ අයදුම්පත.

01. සම්පූර්ණ නම:

02. ලිපිනය: (I) පෞද්ගලික:

(II) රාජකාරී :

03. I. උපන් දිනය: II. ඉල්ලුම්පත් කැඳවන දිනට වයස:

04. දැනට දරණ තනතුර සහ ශ්‍රේණිය:

05. එයට පත්වූ දිනය:

06. ජාතික හැඳුනුම්පත් අංකය:

07. ස්ත්‍රී/පුරුෂ භාවය:

08. විවාහක/අවිවාහක බව:

09. දෙපාර්තමේන්තු සේවා විස්තර:

10. අධ්‍යාපන සුදුසුකම්, වෙනත් සුදුසුකම් සහ පළපුරුද්ද:
(දැන්වීමෙහි 03 වන ඡේදයට අනුව)

I.

II.

III.

Iv.

11. වෙනත් සුදුසුකම්:

ඉහත සඳහන් කරන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය: අයදුම්කරුගේ අත්සන.

අධ්‍යක්ෂ/ආයතන ප්‍රධානියාගේ/විශේෂ ව්‍යාපාර ප්‍රධානියාගේ නිර්දේශය:

ඉහත 1-10 දක්වා වූ කරුණු නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදිය. අයදුම්පත නිර්දේශ කරමි.

අධ්‍යක්ෂ/ආයතන ප්‍රධානියා/විශේෂ ව්‍යාපාර
දිනය: ප්‍රධානියාගේ අත්සන.

ක/-031008.